## ආගමික නිදහස (**DECLARATION ON RELIGIOUS FREEDOM -** ***DIGNITATIS HUMANAE***) **පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා නිර්දේශය: ඉතිහාස අධ්‍යයන ගවේෂණයක්**

එච්. ආර්. එන්. ෆොන්සේකා

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

සභා ඉතිහාසයේ නවෝදයක් උදා කිරීමට මඟ විවර කළ දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පිළිබඳ ජී. ඇල්බෙරිගෝ (G. Alberigo) විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහ භාවිතයට ගෙන මෙම පර්යේෂණ නිබන්ධය ඉදිරිපත් කර ඇත.

**ආගමික නිදහස පිළිබඳ නිර්දේශය** සකස් වූ ආකාරය හා එයට පසුබිම් වූ කරුණු පිළිබඳව පුළුල් විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ.

කිතුනු දැක්ම  අනුව නිදහස යනු දේව දීමනාවකි. එසේ ම තමන් කැමති ඕනෑ ම ආගමක් ඇදහීමට මිනිසාට අයිතියක් ඇත. එය මනුෂ්‍යයෙකු වශයෙන් ඔහුට/ඇයට හිමි මානව අයිතිවාසිකමකි. ආගමික නිදහස යනු තනි පුද්ගලික නිදහසක් නොව සිය අසල්වැසියාට ප්‍රේමය දැක්වීම ය. නමුත් වර්තමානය වන විට ලෝකයේ විවිධ සන්දර්භයන් තුළ ආගමික නිදහස කොතෙක් දුරට පවතින්නේ ද යන්න සහ එහි ස්වභාවය පිළිබඳ පුළුල් ව විමසීම මෙහි පර්යේෂණ ගැටලුව වේ.

මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද ලෙස ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශනයන් දැක්විය හැකිය. ජී. ඇල්බෙරිගෝ විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහට අමතරව විශ්වකෝෂ, ශබ්ද කෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි, අන්තර්ජාලය ආශ්‍රයෙන් ද දත්ත ගොනු කොට තිබේ. එසේ ම තෝරා ගත් ප්‍රධාන මාතෘකාවන්ට අදාළ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි අධ්‍යයනය කරමින් ඒවායේ කරුණු විශ්ලේෂණය කරමින් තොරතුරු රැස් කිරීම සිදු කොට ඇත.

**මූලික පද:** ආගමික නිදහස, දෙවන වතිකාන මන්ත්‍රණ සභාව, අයිතිවාසිකම්